සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය ( ර/ඇඹි/ මාදම්පෙ වි.ජා.පා)

8 ශ්‍රේණිය - සිංහල | දෙවන වාරය | දාහතරවන සතිය

**<u>නාම පද - (2 කොටස)</u>**

➢ පහත සටහන ලියා ගන්න.

- **සර්ව නාම** - යම් කණ්ඩායමක්, වර්ගයක් හැඳින්වීමට පොදුවේ භාවිතා වේ.

  **උදා: (මම, අපි, ඔහු, මොවුහු, නුඹ, තොපි, ඕ, හේ, ඌ, ඒවා .....)**

- **තද්ධිත නාම** - නාම පදයක මුල් රූපයට තද්ධිත ප්‍රත්‍යයක් එක් වූ විට සෑදේ.

  **උදා: ( ගම්+ ඉ - ගැමි) , (දේශ+ඊය- දේශීය) ...**

  පෙළ පොතේ 87 පිටුවේ තද්ධිත නාම වගුව පිටපත් කර ගන්න.

- **සමාස නාම** - නාම පද දෙකක් හෝ කිහිපයක් එක් වීමෙන් සෑදේ.

  **උදා: ( ගස් ද වැල් ද - ගස්වැල්) , (ගුරු ද දෙගුරු ද - ගුරු දෙගුරු)...**

  පෙළ පොතේ 88 පිටුවේ සමාස නාම වගුව පිටපත් කර ගන්න.

- **කෘදන්ත නාම** - ක්‍රියා පදයක මුල් රූපයට කෘදන්ත ප්‍රත්‍ය එක් වූ විට සෑදේ.

  **උදා: (නරඹන්නා, දුටුවෝ, බලන්නා, හිඟන්නා, රකින්නෝ, වවන්නෝ...)**

➢ පිටු අංක 88 හි ලිඛිත අභ්‍යාසය කරන්න.